


**මෙම සමාගමේ කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපොල රත්මලාන පවතින පහත සඳහන් තනතුරෙහි පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## කාර්මික ශිල්පී (හැන්ඩිමන්) II වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය** : රත්මලාන ගුවන් තොටුපොල පරිශ්‍රය හා අත්තිඩිය සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයේ නිල නිවාස, සිවිල් ගුවන් සේවා පුහුණු අංශයේ පවතින සිවිල් නඩත්තු කටයුතු ජලනල කටයුතු, පින්තාරු, පෙදරේරු සහ පෑස්සුම් කටයුතු ආදිය අවශ්‍ය විටදී සිවිල් ඉංජිනේරුතුමා යටතේ කාර්මික නිළධාරී මහත්වරු ලබා දෙන උපදෙස් පරිදි ක්‍රියා කිරීම.

**රැකියාවේ වගකීම්** :

(I) වඩු කාර්මික උපකරණ සම්බන්ධයෙන් සාමාන්‍ය දැනුම

(II) දොර ජනෙල් සවි කිරීම, ගැලවීම පිළිබඳ දැනුම

(III) දොර අගුළු (Lock) සවි කිරීම, දෝෂ සැකසීම ගැන දැනුම

(IV) ඇළුමිනියම් දොරවල් ජනෙල් සවි කිරීම, අගුළු සකස් කිරීම පිළිබඳ දැනුම

(V) ජලනල කාර්මික උපකරණ හා ඒ සම්බන්ධ දැනුම

(VI) ජලමනු කියවීමට හැකි වීම

(VII) ජල කරාම, ජලනල දෝෂ සකස් කිරීමේ හැකියාව

(VIII) පෑස්සුම් කටයුතු හා සම්බන්ධ උපකරණ භාවිතා කිරීමේ හැකියාව

(IX) පෑස්සුම් වැඩ කිරීමේ හැකියාව

(X) මේසන් වැඩ සම්බන්ධයෙන් ඇති දැනුම

(XI) බදාම මිශ්‍රණයක් සාදා ගැනීමට හැකිවිය යුතුය. (උදා:-කපරාරු කිරීම, බිත්ති බැඳීම, කොන්ක්‍රීට් මිශ්‍රණ)

(XII) පින්තාරු වැඩ සඳහා තීන්ත මිශ්‍රණය සාදා ගැනීමට හැකිවීම

(XIII) පොටි ඇදීම හා කැපීම අවශ්‍ය පරිදි මතුපිට සකසා ගැනීමට හැකිවීම

2/-

**1. සුදුසුකම්** : (අ) කාර්මික විද්‍යාලයක් මගින් හෝ තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව (T.V.E.C.) විසින් පිළිගනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන එක් (01) අවුරුදු පූර්ණකාලීන පාඨමාලවක් පෙදරේරු/ ජලනල සහ පින්තාරු ක්ෂේත්‍රයෙන් සාර්ථකව හදාර තිබීම.

**හෝ**

ජාතික වෘත්තිය සුදුසුකම් 4 වන මට්ටමේ (NVQ Level 4) වෘත්තිය සහතිකයක් පෙදරේරු/ ජලනල ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**සහ**

(ආ) ආධුනිකත්ව කාලසීමාවද/ පාඨමාලා කාල සීමාවද /පුහුණු කාල සීමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**සටහන** : තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පින්තාරු ක්ෂේත්‍රය සඳහා නිකුත් කරනු ලබන උපරිම සුදුසුකම වන NVQ Level 3 බැවින් පින්තාරු ක්ෂේත්‍රයෙන් අයදුම් කරන්නේ නම් NVQ Level 3 සහතිකයක් පින්තාරු ක්ෂේත්‍රයෙන් ලබා තිබීම හා වසර 06ක සේවා පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා ඇති අයදුම්කරුවන් පමණක් කාර්මික ශිල්පි (හැන්ඩිමන්) තනතුර සඳහා සලකා බලනු ලැබේ.

**වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප** : තෝරාගනු ලබන්නන්හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**බඳවා ගැනීමේ ක්‍රමය** : ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු :-**

මෙම තනතුරු සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සමාගමට අයත් දිවයිනේ පිහිටි ඕනෑම සේවා ස්ථානයක අවශ්‍ය වූ විට සේවය කල යුතුවේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පතක් **"සභාපති, ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල, කටුනායක" යන ලිපිනයට 2025 මාර්තු මස 04 වන දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ වම් කෙළවරේ **කාර්මික ශිල්පි (හැන්ඩිමන්) 11 වන ශ්‍රේණිය** ලෙස සඳහන් කළ යුතුවේ.

**තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම් ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.**

**පාඨමාලා සහතික, සේවා සහතික සහ අදාළ සහතිකවල ජායා පිටපත් සමග ඉදිරිපත් නොකරන අයදුම්පත් සහ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**සභාපති**
**ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**

**Advertised on 23/02/2025**